**බළන්ගොඩ නගර සභාව**

**2025.09.09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.09.09**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ 2025-08-12 දිනැති මහා සභා වාර්තාව සහ 2025-08-27 දිනැති විශේෂ මහ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව පසුගිය දිනක සිදුවූ ඇල්ල වැල්ලවාය බස් අනතුරෙන් තංගල්ල නගර සභාවේ අභාවප්‍රාප්ත වූ සේවකයන් වෙනුවෙන් සහ බළන්ගොඩ නගර සභාවේ සභිකයන් ලෙස කටයුතු කර අභාවප්‍රාප්ත වූ අසංක විජය නිල්මිණි මැතිතුමා, මුත්තුකුමාර් ගානේෂන් මැතිතුමා යන මන්ත්‍රී දෙපළ වෙනුවෙන් ශෝකය පළ කිරීම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලදී.අනතුරුව අද දින සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2025-08-12 දිනැති මහා සභා වාර්තාව සහ 2025-08-27 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමා විසින් 2025-08-12 දිනැති මහා සභා වාර්තාව සහ 2025-08-27 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පසුගිය 2025-08-12 දිනැති මහ සභා වාර්තාවේ යෝජනා අංක 07:04:01 යටතේ එතුමාගේ අදහස් දැක්වීම තුළ අන්තර්ගත වන " බළන්ගොඩ නගර මධ්‍යයෙහි කොමර්ෂල් බැංකුව සහ ලංකා බැංකුව පිටුපස සංවර්ධනය නොකළ මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස පවතින ඉඩම් සභාවට ඉල්ලුම් කර ප්‍රාග්ධන වටිනාකමින් 2% ක වටිනාකමක් ගෙවා පවරාගෙන ව්‍යාපෘතියක් සඳහා යොදා ගත හැකි බවත්" යන්න " බළන්ගොඩ නගර මධ්‍යයෙහි කොමර්ෂල් බැංකුව සහ ලංකා බැංකුව පිටුපස සංවර්ධනය නොකළ මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස පවතින ඉඩම් වල ප්‍රාග්ධන වටිනාකමින් 2% ක බද්දක් අයකර ගැනීමේ හැකියාවක් පවතින බවත්" ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී. ඒ අනුව 2025-08-12 දිනැති මහ සභාවේ සහ 2025-08-27 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අදදින නිවේදන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අදදින සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**04. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

❖ එළවළු හා මල්පැල ව්‍යාපාරය සිදුකරගෙන යාම සඳහා බළන්ගොඩ නගර සභාව සතු ඉරිදා සතිපොළ තොග වෙළඳ මධ්‍යස්ථානය මාසික කුලී පදනම මත ලබා දෙන ලෙස බළන්ගොඩ නගර සභාවේ හිටපු සභාපති ඩබ්.එම්.නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

දැනට සතිපොළ තොග වෙළඳ මධ්‍යස්ථානය දෛනික කුලී පදනම මත වෙළඳුන්ට ලබා දී ඇති බැවින් මෙම ලිපියෙන් ඉදිරිපත් කර ඇති ඉල්ලීම පිළිබඳව වැඩිදුර කරුණු විමසීම් කර ලබා දීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

❖ බළන්ගොඩ නගර සභා පුස්තකාලයට අනුබද්ධිත කියවීම් ශාලාවේ අලුත්වැඩියා ලෙස තීන්ත ආලේපනය හා විදුලි පංකා අලුත්වැඩියාව සිදු කර දෙන ලෙස දන්වමින් පුස්තකාල සහායිකා එම්.ඩී.ජේ.පෙරේරා මිය විසින් යොමු කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසුයේ එම විදුලි පංකා අලුත්වැඩියාව කඩිනමින් සිදුකර දීම අත්‍යවශ්‍ය බැවින් විදුලි කාර්මිකයන් දැනුවත් කර එම කාර්යය සිදු කළ යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කියවීම් ශාලාව සති අන්ත දිනවලදීද විවෘත කිරීමට කටයුතු සිදු කළ යුතු බවයි.මේ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ සෙනසුරාදා වරුවෙන් පසු කාන්තාවකට තනිවම රාජකාරී කිරීමට තරම් සුදුසු පරිසරයක් එම කියවීම් ශාලා පරිශ්‍රය තුළ නොමැති බවත්, ඒ අනුව සති අන්තයේ දිනවල එම පරිශ්‍රය විවෘත කරන්නේ නම් පිරිමි නිලධාරියෙකු යෙදවීම සුදුසු බවත්ය.

ගරු සභාපතිතුමන් පැවසුයේ ඉහත කියවීම් ශාලාව විවෘත කිරීමේ දින පිළිබඳව අදාළ නිලධාරින් සමඟ සාකච්ඡා කර ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කරන බවයි.

- බළන්ගොඩ බැංකියවත්ත එපිටපැත්ත යන ගම්මානයට පිවිසෙන ප්‍රධාන මාර්ගය ඉතා අබලන් බවත්, බළන්ගොඩ නගර සභාව මඟින් පාලනය වන ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයට නිතර ට්‍රැක්ටර් රථ සහ ගලි බවුසර් රථ ධාවනය වීම එලෙස අබලන් වීමට හේතුව බවත්, එම මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කරන තුරු අළුත්වැඩියා කර පිළිසකර කරදෙන ලෙසත් ඉල්ලීම් කරමින් බැංකියවත්ත සපුමල් ක්‍රීඩා සමාජය යොමු කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී ගරු සභාපතිතුමන් පැවසූයේ ඉල්ලීම් කර ඇති මාර්ගය කඩිනමින් අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිත බවයි.

- 2025.09.07 වන ඉරිදා දින පොහොය නිවාඩුවක් යෙදී තිබීම හේතුවෙන් ඒ වෙනුවට 2025.09.06 වන දින සතිපොළ පැවැත්වීමට කටයුතු සිදු කළ බවත් නමුත් එදින වෙළඳුන් අඩු ප්‍රමාණයක් පැමිණ තිබීම හේතුවෙන් එම දිනය සඳහා ගෙවීම් කළ යුතු රු.85,000 මුදල ගෙවීමට අපහසු බවත් එම මුදල අඩු කර දෙන ලෙසත් ඉල්ලීම් කරමින් සතිපොළ බදුකරු වන සුජීව කුමාර යන අය යොමු කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් පැවසූයේ ආදායම් පරීක්ෂක වාර්තාව තවම ලැබී නොමැති බවත්, මෙම දිනයට ගාස්තු අයකිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු බවත්ය.

  ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා තම අදහස් දක්වමින් පැවසූයේ සතිපොළ ටෙන්ඩර්කරු ටෙන්ඩරය ලබාගෙන ඇත්තේ එවැනි අවධානමක් සහිතව බැවින් සතිපොළ ගාස්තුව වන රු.85,000 මුදල අයකළයුතු බවට යෝජනා කරන බවයි. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

- බළන්ගොඩ නගර සභා සීමාවේ ඇති වැසිජල කාණු ඉදිරියේදී දෛනික වැටුප මත සේවකයන් යොදවා පවිත්‍ර කිරීමට කටයුතු සලසා ඇති බවත්, මෙම වැසිජල කාණු වලට ඇතැම් ගොඩනැගිලිවල මලාපවහන බට මුදාහැර ඇති බවට මහජන පැමිණිලි ලැබෙන බවත්, කාණු පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කිරීමේදී මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර එසේ මුදාහැර ඇති බට ස්ථිර වශයෙන් වසා දැමීමට අනුමැතිය ලබා දෙන ලෙසත් දන්වමින් බළන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ඉහත කාරණාව පිළිබඳ ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමා අදහස් දක්වමින් මේ සඳහා සභා අනුමැතිය අනවශ්‍ය බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ බලතල ක්‍රියාත්මක කර

මෙම ගැටළුව විසඳිය හැකි බවත්, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ බලතල මඟින් මෙය ක්‍රියාත්මක කළ හැකි වුවද වැඩිදුරටත් අවශ්‍ය වන අනුමැතිය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් මෙලෙස මළ අපද්‍රව්‍ය කාණු තුළට හරවා තිබීමට සභාවේ ලීටර් 4000 ගලි බවුසරය ලබාගැනීමේ මිල අධික බව විය හැකි බවත්, ලීටර් 2500 ගලි බවුසර් සේවාව ලබා දිය හැකි පරිදි කඩිනමින් එහි අලුත්වැඩියා කළ යුතු බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ ලීටර් 2500 ගලි බවුසරය අලුත්වැඩියා කිරීමට යොමු කර ඇති බවත් මේ වන විට අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය අමතර කොටස් ගෙන්වා අවසන් බැවින් කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවයි.

මේ අවස්ථාවේ ගරාජයේ ගලි බවුසරයේ අලුත්වැඩියා කටයුතු  සිදු කිරීම පිළිබඳ සභාවේ දීර්ඝ සාකච්ඡාවක් ඇති විය. අනතුරුව සභාවේ කාර්මික නිලධාරී මහතාගෙන් එකී අලුත්වැඩියාවන් පිළිබඳ වැඩිදුර කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

❖ නගරයේ අත්‍යවශ්‍ය වීථි ලාම්පු සවි කිරීම කඩිනම් කිරීම පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ඉහත ගැටළුව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුයේ අවස්ථා දෙකකදී වීථි පහන් බල්බ මිලදීගත් බවත්, එම වීථි පහන් සභාවෙන් ඉදිරිපත් කරන ලද පිරිවිතරවලට අනුකූල නොවූ බැවින් නැවත හරවා යැවීමට සිදු වූ බවයි.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය තම අදහස් දක්වමින් ඉහත සභාවට රැගෙන විත් ඇති බල්බ පිළිබඳව සොයා බැලූ බවත්, බල්බ ගෙන ආ සමාගමෙන් එම බල්බය indoor බල්බ වර්ගයක් ලෙස සඳහන් කළ බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම බල්බ මිලදී ගැනීමට අවස්ථා තුනකදී මුදල් කාරක සභාවෙන් අනුමැතිය ලබා දුන් බවත්, ඒ අනුව මෙම බල්බ මිලදී ගැනීමට අදාළව පිරිවිතර ලබා දුන්නේ කව්රුන්ද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ කාර්මික නිලධාරී මහතා පිරිවිතර ලබා දුන් බවයි.අනතුරුව එතුමා වැඩිදුරටත් විමසීම් කරමින් කාර්මික නිලධාරිගේ පිරිවිතර ලබා දීම් මත සහ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත මෙම මිලදී ගැනීම් සිදු වූයේද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ බල්බ පිළිබඳව දිගින් දිගටම ප්‍රශ්න ඇතිවූ බැවින් ඉදිරිපත් කර ඇති පිරිවිතර වලට අනුව බල්බ මිලදී ගැනීමට බල්බ සැපයුම්කරුවන් නොවූ බැවින් ඇඹිලිපිටිය නගර සභාව , තණමල්විල ප්‍රාදේශීය සභාව වැනි වෙනත් සභාවන් වල භාවිතා කරන බල්බ වර්ගයක් සභාවේ කාර්මික නිලධාරී සහ විදුලි කාර්මික සමඟ පරීක්ෂා කර රැගෙන ආ බවත් එම නියෝජිත ආයතනය වසර 03ක වගකීම් කාලයක් ලබා දෙන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින්, මීට පෙර කොළඹින් බල්බ වර්ගයක් රැගෙනවිත් ඇති බවත්, එම බල්බ සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ පිරිවිතර වලට අනුකූල නොවන බවත්, එලෙස රැගෙන ආ විදුලි බල්බ බුලත්ගම දමා ආපසු ගලවන බවත්, එසේ කිරීම මඟින් සභාවෙන් ඒ සඳහා යෙදවූ සේවකයන්ගේ වැටුප්, වාහනවලට යෙදවූ ඉන්ධන ආදිය නාස්තියක් බවත්, ඒවාට වගකියන්නේ කව්ද යන්නත් විමසන ලදී.

ඉහත ගැටළු සියල්ල සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

**05:01:01** 2025/07/08 දින සූර්ය පැනල 20 ක් ලබාගැනීමට යෝජනා වී ඇති අතර, එම සූර්ය පැනල ලබාගන්නේ කවදාද ?

එල්.ඊ.ඩී පැනල් 20ක් සඳහා මිල ගණන් කැඳවීමේ කටයුතු සිදු කර ඇත.

**05:01:02** ශෛලතලාරාම මාර්ගයේ ඉහළ කොටසට නොදිරන කසළ පමණක් එකතු කිරීමට රථය යොදවා ඇද්ද? වැලිහරනාව මාර්ගයේ කොපමණ දුරක් ට්‍රැක්ටර් රථය ගමන් කරයි ද ?

ශෛලතලාරාම මාර්ගයේ තරංගනී මන්ත්‍රීතුමියගේ නිවසට ඉහළින් ඇති පිට්ටනිය අසළ උඩ පැත්තට ට්‍රැක්ටරය යොදවා ඇත.ඉන් ඉදිරිපිට මාර්ගයේ ට්‍රැක්ටර් රථය ගමන් කිරීමට අපහසු

බව රියදුරු දන්වා ඇත.වැලිහරනාව මාර්ගයේ වට රවුම හා ජල සම්පාදන මණ්ඩලය පාරේ මීටර් 600 ක් පමණ ගමන් කරනු ලැබේ.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මීට පෙර ශෛලතලාරාම මාර්ගයේ පන්සල දක්වා නොදිරන කසළ එකතු කිරීමට ට්‍රැක්ටර් රථය යෙදවීමට යෝජනා කළ බව පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ ට්‍රැක්ටර් රථ ගමන් කිරීමට නොහැකි මාර්ග පිළිබඳ අධීක්ෂණ නිලධාරින් යොදවා අධීක්ෂණයක් සිදුකර එම මාර්ග වල නොදිරන කසළ එකතු කිරීමට ඉදිරියේදී සභාව සතු ටිපර් රථය හෝ යෙදවීමට කටයුතු යොදන බව පවසන ලදී.

**05:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා**

**05:02:01** දොරවෙල ටයර් කඩය ඉදිරිපිට RDA මගින් යොදා ඇති කාණුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීමට හේතුව කවරේද ?

දොරවෙල එන්.ටී.ආර් ටයර් කඩය ඉදිරිපිට කාණුවේ ජලය මුගුණමලය මාර්ගයට ගලා ඒම වැළැක්වීම සඳහා එම වැසි ජල කාණුව වෙනත් දිශාවකට යොමු කරන ලෙස RDA විධායක ඉංජිනේරු වෙත බනස/ක/3/4/1 හා 2025.09.08 දිනැති ලිපිය මඟින් දන්වන ලදී.

**05:02:02** ඉත්තගලහේන ප්‍රදේශයේ ඩෙස්මන් මහතාගේ නිවස අසල හා ඉහළ කොටසේ ජලය බැස යාම සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකිරීමට පසුගිය කර්මාන්ත කමිටුවේ දී තීරණය වී තිබුණු අතර, එම වර්තමාන තත්ත්වය කවරේද?

ඉහත ස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂාව ඉදිරියේදී සිදු කිරීමට නියමිතයි.

**05:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**05:03:01** මා විසින් පසුගිය මහා සභා වලදී සභාගත කරන ලද අලුත්වැඩියා කිරීම් සහ කර්මාන්ත ඉදිකිරීම් සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කුමක් ද ?

බෝම්බුව පරගහකුඹුර මාර්ගය සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු සකස් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත.

**05:04 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.සිසිල චන්දන මැතිතුමා**

**05:04:01** වැවවත්ත උද්‍යානයේ මරණාධාර සමිතිය විසින් එම උද්‍යානයේ පිහිටි සේවා පියසට අයත් භූමියෙන් ඔවුන්ගේ සුබ සාධන කටයුතු පවත්වාගෙන යාම සඳහා කාමරයක් ලබාදෙන ලෙස හෝ සුදුසු කටයුත්තක් කරදෙන ලෙස ගරු සභාවට ලිපි යොමුකර ඇතත්, ඔවුනට ප්‍රති උත්තර ලිපියක් හෝ යවා නොමැති බැවින්, එම ගැටළුවෙහි වර්තමාන තත්ත්වය කෙසේ ද?

ගරු සභාපතිතුමා පැවසූයේ රටේ ජනගහනයෙන් සෑම 6000 කට ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක් තිබිය යුතු බවට වන සංකල්පය මත රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු

මන්ත්‍රීතුමා ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට වැවවත්ත උද්‍යානයේ පරිශ්‍රය යොදාගැනීමට යෝජනා කළ බවත් ඒ පිළිබඳව තවමත් නිශ්චිත පිළිතුරක් නොමැති බවත් , ඒ අනුව වැවවත්ත ප්‍රජා එකමුතු සමිතියේ භාණ්ඩ තැබීම සඳහා එම ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ලබා දිය නොහැකි බවට බනස/ක/3/16 හා 2025.08.27 දිනැති ලිපිය මඟින් එම්.ඩබ්.එල්.එස් සේනාධීර මයා වෙත දන්වන ලද බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ ඉහත පරිදි වැවේවත්ත උද්‍යාන භූමිය ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීමට නිශ්චිත නොවන බවත් ඒ පිළිබඳව රත්නපුර දිසිත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සමඟ තමන් සාකච්ඡා කළ බවත්, ඒ අනුව ස්ථානය ලබා දීමට හැකියාවක් නොමැති බවට දන්වා යැවූ ලිපිය නිවරදි නොවන බවත්ය.ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පවසා සිටියේ රත්නපුර දිසිත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සමඟ එකී භූමිය පරීක්ෂා කළ බවත් එම ඉදිකිරීම පිළිබඳ තවම නිශ්චිත පිළිතුරක් නොලැබුන බැවින් එකී පරිශ්‍රය වෙනත් කටයුතු සඳහා ලබා දීමේ හැකියාවක් නොවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ වැවවත්ත ප්‍රජාශාලා භූමිය ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීමට මීන් පෙර සභා සැසිවාරවලදීද යෝජනා වී ඊට අදාළව සැලසුම් පවා සකස් කිරීමද සිදු කළ බවයි.

**05:04:02** වැවේවත්ත හිටපු ඉංග්‍රීසි භාෂා අධ්‍යක්ෂක චන්ද්‍රරත්න මහතාගේ නිවස අසලින් ඇති ඇළ මාර්ගයට ගමන් කිරීමට ඇති මාර්ග කොටස පිළිසකර කිරිම සඳහා මෙම ගරු සභාව දැනුවත් කර ඇතත්, ඒ සඳහා ක්‍රියාත්මක නොවීම සහ එහි වර්තමාන තත්වය කෙසේද?

ගරු සභාපතිතුමා ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ ඉහත සඳහන් ස්ථානයේ ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත්, ඒ අනුව ඉතා කඩිනමින් ඉටු කළ යුතු සංවර්ධන කාර්යයක් නොවන බවත්,ඊට වඩා කඩිනමින් කළයුතු මාර්ග නඩත්තු කටයුතු රාශියක් පවතින බවත්,මෙම ඉල්ලීම ඉදිරි 2026 වර්ෂයේ අයවැය වෙත ඉදිරිපත් කිරීමට යොමු කළ බවත්ය.

**05:05 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**05:05:01** මෙම වර්ෂයේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා මුද්දර ගාස්තු වශයෙන් සභාවට කොපමණ මුදලක් ලැබී තිබේද?

2025.01.01 සිට 2025.08.31 දක්වා කාලය තුළ මුද්දර ගාස්තු වශයෙන් රු.12,638,006.00 ක් ලැබී ඇත.

**05:05:02** මෙම වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මාසය දක්වා ප්‍රාග්ධන වියදම් ලෙස සංවර්ධන කටයුතු වෙනුවෙන් කොපමණ මුදලක් වැයකර තිබේද ?

2025.01.01 සිට 2025.08.31 දක්වා කාලය තුළ සභා අරමුදල් වලින් රු.3,324,091.16 ක්ද වෙනත් අරමුදල් වලින් රු.320,301.09 ක්ද ලෙස සංවර්ධන වැය දරා ඇත.

**05:05:03** 2025/08/12 දින සභාවේ යෝජනා අංක 07:04:01 යටතේ සම්මත වු යෝජනා ක්‍රියාත්මක කිරීමට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත යෝජනාව සම්බන්ධයෙන් අදාළ මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා කළ බවත් ඒ අනුව ඉඩම පිරිසිදු කිරීමට කටයුතු සැලසීමට බැංකුව එකඟ වූ බවත්,සභාව වෙත පවරා ගෙන ස්ථිර ඉදිකිරීමක් නොකර යම්කිසි ව්‍යාපෘතියකට යොදා ගැනීම සම්බන්ධවද සාකච්ඡා කළ බවත් ඒ අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ඒ සම්බන්ධව අවශ්‍ය බව කළමණාකාරිත්වය පැවසූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඉහත ඉල්ලීම් ලිඛිතව යොමුකළ යුතු බව වන අතර ගරු සභාපතිතුමා ඊට අදාළව ලිපි යොමු කිරීමට කටයුතු සිදු කරන බව පැවසීය.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා**

**06:01:01** බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා පුස්තකාල සහයකයින් දෙදෙනෙකු බඳවා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.එස් සිසිල චන්දන මැතිතුමා අදහස් දක්වමින් පුස්තකාල සහායක බඳවාගැනීමක් සිදුවන්නේ නම් පුස්තකාල උපදේශන කාරක සභාව මඟින් පුස්තකාල බඳවාගැනීම් සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් රාජ්‍ය ආයතන වලට බඳවා ගැනීම් සම්බන්ධව 2021 ආමාත්‍ය මණ්ඩල තීරණයක් පවතින බවත්, ඒ අනුව එය මේ වන විටත් එය වලංගුව පවතින බවත්, පුස්තකාලයේ සේවකයන් ප්‍රමාණවත් මට්ටමින් සිටින බැවින් එම බඳවාගැනීමට තමන් විරුද්ධ වන බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ, මෙම පුස්තකාල සහායකයන් බඳවාගන්නේ තාවකාලික පදනම මත බවත් ස්ථිරව බඳවාගැනීමේ තීරණයක් ගැනීමට සභාවට නොහැකි බවත්, පුස්තකාල සහායකයින් 02 දෙනෙකුගේ පුරප්පාඩුව පිළිබඳ ඉල්ලීම් ලිපි ලැබී ඇති බවත්, ඒ අනුව මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්ය.

මීන් පෙර විශේෂ සභාවක් මඟින් තීරණය කර කම්කරුවන් බඳවාගැනීමට යෝජනා සම්මතයක් ලබා ගැනීම පිළිබඳව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ප්‍රශ්න කරන ලදුව ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ එම යෝජනාව මේ වන විට පළාත් පාලන කොමසාරිස් මඟින් ගරු ආණ්ඩුකාරතුමිය වෙත යොමු කර ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ දැනට පුස්තකාලයේ පුස්තකාල සහායක 03 දෙනෙකු සිටින බවත්, පසුගිය සභාවන් වලදී පුස්තකාල සහායක හා වෙනත් රාජකාරීවල සෞඛ්‍ය කම්කරුවන් යොදවා ඇති බව පැවසූ බවත්, ඒ අනුව දැනට එලෙස යොදවා ඇති පුස්තකාල සහායකවරුන්හට ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න පැහැදිලි කරන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා නැවතත් තම අදහස් දක්වමින් පැවසුයේ තමන් පෙර පැවසූ ආකාරයට පුස්තකාල උපදේශන කාරක සභාවේ මෙම ගැටළුව සාකච්ඡා වූයේ නම් සභාවේ කාලය මෙලෙස අපතේ නොයවා කාලය ඉතිරි කිරීමට හැකි බවයි.

අනතුරුව ගරු සභාපතිතුමා ඉහත ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ අදහස් පිළිගන්නා බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා තම අදහස් දක්වමින් පවසා සිටියේ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමාගේ අදහස් දැක්වීම මගින් විරුද්ධත්වය ප්‍රකාශ නොකළ බවත් එහි අදහස වූයේ පුස්තකාල සහායක බඳවාගැනීමට අදාළව පුරප්පාඩුව පිළිබඳ අධ්‍යනයක් සිදු කර තිබුනේ නම් එය වැදගත් වන බවයි.ඒ අනුව එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙම බඳවාගැනීමට අදාළව නිසි අධ්‍යනයක් සිදු කර ඉහත ගරු සභාපතිතුමාගේ යෝජනාව පිළිබඳ සලකා බැලීම සිදු කිරීම සුදුසු බව පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පවසා සිටියේ මේ වන විට සභාවේ පුස්තකාලාධිපති තනතුර සඳහා පුරප්පාඩුවක් පවතින බවයි.

පුස්තකාලයේ තනතුරු පුරප්පාඩුව පිළිබඳ වැඩිදුර කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ පුස්තකාල සහායිකා බඳවාගැනීමේ ඉල්ලීම පුස්තකාල උපදේශන කමිටුව හරහා නිර්දේශ වී පැමිණිය යුතු බැවින් එම සමාලෝචනයන් සිදුකර ඉදිරියේදී සලකා බැලීම සුදුසු බවයි.

**06:01:02** කල්තොට මාර්ගයේ අතුරු මාර්ගයක් වන අලාබ්දීන් මාවත සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් පවසා සිටියේ අලාබ්දීන් මාවත නගර සභා කොට්ඨාශ දෙකක් නියෝජනය කරන මාර්ගයක් බවත් එම මාර්ගය මේ වන විට වාහන ගමන් කිරීමට නොහැකි ලෙස අබලන් වී ඇති බවත්, කඩිනමින් අළුත්වැඩියා කළ යුතුව පවතින බවත්ය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:03** දෙහිගස්තලාව එකේ කණුව අසල සිට කුමාරගම විහාරස්ථානය දෙසට ඇති මාර්ගයේ අතුරු මාර්ගයක් වන එච්.ඒ.ඩී.සිරිසේන මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:04** දෙහිගස්තලාව ජෙයිලානී විද්‍යාලයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:05** බෝම්බුව නගර සභා නිවාස සංකීර්ණයට පිවිසෙන මාර්ගය ජයන්ත මහතාගේ කඩය අසල සිට සමරසිංහ මහතාගේ නිවස දෙසට ඇති මාර්ග කොටස සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තමන් ඉහත යෝජනාව මිරිස්කොටුව මාර්ගය නමින් පළමු සභාවාරයේදීම තමාගේ යෝජනා යටතේ ඉදිරිපත් කළ බවයි.ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කර්මාන්ත කාරක සභාව මඟින් නිර්දේශ වන සංවර්ධන යෝජනා ඉටු කළ යුතු බවත් මෙලෙස ඉදිරිපත් කරන යෝජනා මඟින් එලෙස නිර්දේශ වන යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් කොට්ඨාශවල මාර්ග අළුත්වැඩියා සිදු කිරීමේදි අදාළ සභිකවරයා දැනුවත් විය යුතු බව පැවසීය.

ගරු සභාපතිතුමන් පැවසූයේ මහජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් සලකා යෝජනා ඉදිරිපත් කරන බවත්, යෝජනා ඉදිරිපත් කළ පමණින්ම එසැණින්, ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කළ නොහැකි බවත්,අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා සභාවට ඉදිරිපත් කළ යුතු බවත්, අරමුදල් තිබෙන ප්‍රමාණය පරිදි ක්‍රියාත්මක කරන බවත්,ඇතැම් යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා පැමිණෙන බවත් ඒ අනුව ඒවා ඉටුකළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා මෙම යෝජනා කර්මාන්ත කාරක සභාව හරහා පැමිණෙන්නේ නම් මෙලෙස ගැටළුකාරි නොවන බවත් ඒ අනුව මෙම මාර්ග සංවර්ධන යෝජනා කර්මාන්ත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට තමන් යෝජනා කරන බවත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත ගරු සභාපතිතුමාගේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:06** නගර සභාව විසින් භුක්ති විදිනු ලබන පහත සඳහන් ඉඩම් පවරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම.

| **අනු අංකය** | **ඉඩමේ නම** | **වර්තමාන භාවිතය** |
|---|---|---|
| 01 | ගල් කොරටුවත්ත | ලේකම්, ආදායම් පරීක්ෂක නිල නිවස |
| 02 | නිකකැටියවත්ත | බාන්ස් රත්වත්ත මාවතේ අංක 4,6,8 දරණ නිල නිවාස |
| 03 | මැණික් කඩ පිහිටි ඉඩම | මැණික් කඩ දෙමහල් ගොඩනැගිල්ල |

| | | |
|---|---|---|
| 04 | දොරෙයිසාමි සින්නයියාගේ වත්ත | පොදු ළිද |
| 05 | කරදියමුල්ල ප්‍රජා ශාලාව පිහිටි ඉඩම | කරදියමුල්ල ප්‍රජා ශාලව |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත ඉදිරිපත් කර ඇති ඉඩම්වල වර්තමාන අයිතිය පවතින්නේ කා හටද යන්න විමසන ලදී.මෙම ඉඩම්වල වර්තමාන අයිතිය පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්කරන ලදී.

ලේකම්තුමියගෙන් අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා, මෙම ඉඩම් නිරවුල් කර සභාව නමින් අයිතිය පවරාගැනීම පිණිස සභාවේ එකඟත්වය ලබා ගැනීම අවශ්‍ය බැවින් මෙලෙස ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව සභාවේ එකඟතාවය ලබා දෙන ලෙසත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත ගරු සභාපතිතුමාගේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:07** ජාතික විගණන කාර්යාලයේ විගණන නිලධාරීන් විසින් බළන්ගොඩ නගර සභාවේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම වෙනුවෙන්, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18 වගන්තිය ප්‍රකාරව නගර සභාවේ අදාල ගිණුම් වර්ෂයේ ආදායම් පදනම් කරගෙන ගණනය කරන ලද , රු.814,110.21 ක විගණන ගාස්තුව ගෙවීම් කිරීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:08** බැංකියවත්ත කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ සේවය කරන සේවකයින් සඳහා තේ පානය කිරීමට මසකට සීනි 7 kg සහ තේ කොළ 2 kg ලබාදීමට අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ මෙම යෝජනාව කර්මාන්ත කාරක සභාවේ නිර්දේශ වූ බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:09** අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය-ප්‍රාදේශීය කමිටු ස්ථාපිත කිරීම යන මැයෙන් 2025/08/20 දිනැතිව පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG07/03/07 අංක දරණ ලිපියෙන් දන්වා ඇති පරිදි පහත සඳහන් සංයුතියෙන් යුක්තව සන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව ප්‍රාදේශීය කමිටු ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම.

සංයුතිය

- පළාත් පාලන ආයතනයේ නියෝජිතයන් ( සභාපති/මහජන නියෝජිතයන් හා නිලධාරීන් )
- ප්‍රාදේශීය ලේකම්
- පරිසර පොලීසිය
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
- ගොවිජන සේවා නිලධාරී
- දිස්ත්‍රික් කෘෂි කර්ම නිලධාරී
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
- ප්‍රජා සංවිධාන/ස්වේඡා සංවිධාන
- පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරී
- වෙනත් සුදුසු නිලධාරීන්

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:10** බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩරය සඳහා (205/08/16 සිට 2025/08/31 දක්වා ) රු.525,000 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:11** 2025/11/01 සිට 2026/10/31 දක්වා කාලයට අදාළව බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩරයේ ටෙන්ඩර් ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, ශෛලතලාරාම මාර්ගයේ මුගුණමලය දොරවෙල දක්වා සතියකට එක් දිනක් නොදිරන කසළ ඉවත් කිරීම සඳහා ට්‍රැක්ටර් යෙදවීමට සහ ශෛලතාරාම මාර්ගයේ කසළ එකතුකිරීම සඳහා ට්‍රැක්ටර් රථ යෙදවීම යන කොන්දේසි කසළ ඉවත්කිරීමේ ටෙන්ඩරයේ ටෙන්ඩර් කොන්දේසි තුළට ඇතුළත් කිරීම සඳහා මීන් පෙර යෝජනා කලද එය ඇතුළත් වී නොමැති බැවින් එම මාර්ග ඇතුළත් කර කසළ ටෙන්ඩරයේ කොන්දේසි සංශෝධනය විය යුතු බවට යෝජනා කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත සංශෝධනයන් කසළ ටෙන්ඩරයේ ගිවිසුම් කෙටුම්පතට ඇතුළත් කිරීම සුදුසු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත යෝජනාව සංශෝධන සහිතව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:12** බළන්ගොඩ නගර සභාව සතු ටෙන්ඩර් දැන්වීම් පුවරු අංක 01 සිට අංක 10 දක්වා දැන්වීම් පුවරු 10යේ බදු කාලය 2025 වර්ෂයේ අවසන් වන අතර 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් ක්‍රමවේද මගින් බදුකරුවන් තෝරා පත්කර ගත යුතුයි.

| දැන්වීම් පුවරු අංකය | ස්ථානය | අවසන්වරට ටෙන්ඩර් නිකුත්කළ වටිනාකම | ටෙන්ඩර් කාලය අවසන්වන දිනය | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|
| 01 | දෙරවල රා කඩය ඉදිරිපිට | රු. 4200.00 | ගිවිසුම් අවසන් කර ටෙන්ඩර් කිරිමට ඇත- අළුත්වැඩියා කටයුතු කරමින් තිබේ. | රු. 4000.00 |
| 02 | දෙරවල රා කඩය ඉදිරිපිට | රු. 4250.00 | 2025.12.15 | රු. 4000.00 |
| 03 | දෙරවල රා කඩය ඉදිරිපිට | රු. 4320.00 | ගිවිසුම් අවසන් කර ටෙන්ඩර් කිරිමට ඇත | රු. 4000.00 |
| 04 | CTB බස්නැවතුමපල අසල | රු. 4250.00 | 2025.11.30 | රු. 4000.00 |
| 05 | මහජන බැංකුව ඉදිරිපිට | රු. 4700.00 | 2025.11.30 | රු. 4000.00 |
| 06 | තුඹගොඩ සමන් දේව ප්‍රතිමාව අසල | රු. 4250.00 | 2025.11.30 | රු. 4000.00 |
| 07 | කොන්වන්ට් පාසල ඉදිරිපිට | රු. 2370.00 | 2025.11.30 | රු. 4000.00 |
| 08 | ඕලුගංතොට පාලම අසල | රු. 2250.00 | 2025.11.30 | රු. 4000.00 |
| 09 | සරස්වතී පාර අසල | රු. 2100.00 | 2025.12.31 | රු. 4000.00 |
| 10 | පල්ලෙකඹුර පාර පිවිසුම අසල | රු. 2380.00 | 2025.12.15 | රු. 4000.00 |

**අවසන් වරට ටෙන්ඩර් කිරීමට අදාළ විස්තර පහත පරිදි වේ.**

- ටෙන්ඩර් කරන ලද ක්‍රමවේදය - ප්‍රාදේශීය ටෙන්ඩර්
- ආපසු ගෙවන ලද ටෙන්ඩර් ඇප - රු. 2,000.00
- අයදුම්පත්‍ර ගාස්තුව - රු 1,000.00

ඒ අනුව ඉදිරි වර්ෂයක කාලයකට බදු දීම සඳහා අනුමැතිය ලබාගැනිම හා ටෙන්ඩර් කිරීමේ සුදුසු ක්‍රමවේදය පිළිබඳව තීරණය කරගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ දැන්වීම් පුවරු ස්ථාපිත කර ඇති ස්ථානය අනුව දැන්වීම් පුවරු වල අවම මාසික ලංසු මුදල වෙනස් විය යුතු බවද ,දැනට සියළුම ස්ථාන වලින් සමාන මුදලක් අය කරන බවද, දොරවෙල රා කඩය ඉදිරිපිට දැන්වීම් පුවරු සියල්ලම ඉතාම අපිළිවෙල බවද ආකර්ෂණීය නගරයට යන ගමනේදී ඒවා විධිමත්ව සකස් කර ටෙන්ඩර් කැඳවීම සුදුසු බවද පවසන ලදී.

ඒ අනුව දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකිරීම පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාවේ තීරණය විය.

**06:01:13** බලන්ගොඩ නගර සභාව සතු පොළ කඩ අංක 18 කඩ කාමරයේ බදු කාලය 2025 ඔක්තෝබර් මස 20 වන දිනෙන් අවසන් වන අතර 2025 ඔක්තෝබර් මස 21 වන දින සිට 2026 ඔක්තෝබර් මස 20 වන දින දක්වා වූ කාලය සඳහා ටෙන්ඩර් ක්‍රමවේද මගින් බදුකරුවන් තෝරා පත්කර ගැනීම.

අවසන් වරට ටෙන්ඩර් කිරීමට අදාළ විස්තර පහත පරිදි වේ.

- වර්ෂය - 2024.10.21 – 2025.10.20
- ටෙන්ඩර් ලබාගත් මුදල (මාසික)- රු . 4,500.00
- ටෙන්ඩර් කරන ලද ක්‍රමවේදය - ප්‍රාදේශීය ටෙන්ඩර්
- ආපසු ගෙවන ලද ටෙන්ඩර් ඇප - රු. 5,000.00
- අයදුම්පත්‍ර ගාස්තුව - රු 1,000.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව බලන්ගොඩ නගර සභාව සතු පොළ කඩ අංක 18 කඩ කාමරය 2025 ඔක්තෝබර් මස 21 වන දින සිට 2026 ඔක්තෝබර් මස 20 වන දින දක්වා වූ කාලය සඳහා බදුකරුවන් තෝරා පත්කර ගැනීම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් ක්‍රමවේදය මඟින් ඉහත අවම ලංසු මුදල යටතේම ටෙන්ඩර් කැඳවීම සුදුසු බවට වන යෝජනාව ගරු සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**06:01:14** 2025.08.01 සිට 2025.08.31 දක්වා සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් B.K.J Petroleum වෙත රු.783,162.31 ක් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:15** බලන්ගොඩ නගර සභාව සතු සාප්පු කඩ අංක 01, පොළ කඩ අංක 05, මැණික් කඩ අංක 08 දරණ කඩ කාමරවල වර්තමාන බදුකරු මියගොස් ඇති බැවින් කී මනි මුදලක් ලබා ගෙන විධිමත්ව ගිවිසුම් ගත වන තෙක් අනුප්‍රාප්තිකයා සමඟ තාවකාලිකව ගිවිසුම් ගත වීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:16** අනදමෙත්ගම මාර්ගයේ පැති බැම්ම හා ජලාපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම කර්මාන්තයට අදාළ අවසන් බිල්පත රු.831,304.40 (පළාත් සභා අරමුදල්) ශ්‍රම උදාන සුභ සාධක සංවිධානය වෙත ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:17** බළන්ගොඩ නගර සභා සීමාව තුළ ට්‍රැක්ටර් රථ ධාවනය කල නොහැකි මාර්ගවල කසළ එකතු කිරීම සඳහා ත්‍රිරෝද රථයක් මිලදී ගැනීම සඳහා වන දළ ඇස්තමේන්තුව රු.ලක්ෂ 20 සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.මන්ත්‍රී යෝජනා**

**06:02** **ගරු උපසභාපති පේෂල නිකලන්ද මැතිතුමා**

**06:02:01** ඕළුගන්තොට රබර්වත්ත මාර්ගයේ සිට සියඹලාගහවත්ත දක්වා මාර්ගය දැනට කොන්ක්‍රීට් අතුරා ඇති අතර එහි එක් ස්ථානයක දකුණු පස ඉවුර නාය යැමට ලක්ව ඇති අතර, එම මාර්ගය සම්පූර්ණයෙන් නාය යැමේ දැඩි අවධානමක් පවතින බැවින්, එම ස්ථානයේ ආරක්ෂක පැති බැම්මක් හැකි ඉක්මනින් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:02:02** ඕළුගන්තොට සිට රයි වත්ත හරහා වැලිහරනාව දක්වා දිවෙන මාර්ගයේ නගර සභා සීමාවට අයත් ප්‍රධාන මාර්ගයේ සිට තේ කර්මාන්ත ශාලාවේ පිවිසුම් ගේට්ටුව දක්වා වූ කොටස මේ වන විට දැඩි ලෙස අබලන්ව පවතී. එබැවින්, එම මාර්ගය දෛනිකව විශාල පිරිසක් විසින් භාවිතා කරන බැවින් එම කොටස තාර යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:03** **ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

**06:03:01** බළන්ගොඩ නගර සභාව මගින් අංක 53 කිරිදිගල, බලන්ගොඩ ලිපිනයේ පදිංචි එන්.ඒ.මාධවී චතුරිකා යන අයට යොමු කර ඇති අංක බනස/ක/03 හා 2024.04.26 දිනැති ලිපිය, අංක 36 අනදමෙත්ගම ,බලන්ගොඩ ලිපිනයේ ඩී.එම්.එම්.බණ්ඩාර යන අයට අංක බනස/ක/03 හා

2023.10.27 දිනැතිව යොමු කර ඇති ලිපිය හා 952/ඒ/5 නුගමුලහේන කිරිදිගල බලන්ගොඩ යන ලිපිනයේ පදිංචි ඒ.එම්.සමෘද්ධිකා බණ්ඩාර යන අයට පිටපත් කර යැවූ ලිපිවල අඩංගු කරුණු පිළිබඳව සභාවේ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය ඉහත සභාව මඟින් යොමුකර ඇති ලිපිවලින් දක්වා ඇති පරිදි ඉන් ඉදිරියට සභාව මඟින් ක්‍රියාමාර්ග ගනු ලබන්නේදැයි විමසන ලදුව ඒ වෙනුවෙන් ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ගරු සභාපතිතුමන් විසින් පෙ.ව.11.45 ට පමණ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා වෙත මූලාසනය භාර දී සභාවෙන් පිටවන ලදී.**

කාරක සභාවේ සාකච්ඡාව අනුව ඉහත ඉදිරිපත් කර ඇති ගැටළුව දෙපාර්ශවයක් අතර ගැටුමක් බැවින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එක් පාර්ශවකට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් සභාවට නොමැති බවටත්, එලෙස නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව පවතින අනවසර ඉදිකිරීම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් සභාව තීරණය කරන ලදී.

**06:03:02** රබර්වත්ත මාර්ගයේ රෝහිණී මහත්මියගේ නිවස අසල මාර්ගයේ මැද ඇති විදුලි කණුව මාර්ගයේ එක් පසකට යොමු කිරිම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:03:03** සියඹලාගහවත්ත මාර්ගයේ සිරිපාල මහතාගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:03:04** දොරවෙල මුගුණමලේ මාර්ගය පටන් ගන්නා ස්ථානයේ සිට ඉදිරියට බෝක්කුව දක්වා කාණුව සකස් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:04 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා**

**06:04:01** නුගගහ හේන මාර්ගයේ කාණුව ගොඩ දමා ජලය බැස යාම විධිමත් කිරිම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:04:02** තොසිල ගාර්ඩන් උපුල් මහතාගේ නිවස අසල මාර්ගය හා ජල බස්නා කාණුව සංවර්ධනය කිරිම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06:04:03** කිරිදිගල කැප්ටන් මහතාගේ නිවස අසල දැඩි බෑවුම සහිත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් කිරිදිගල ග්‍රාම නිලධාරී කාර්යාලය පසුකර ඕලුගංතොට පැත්තට ඇති මාර්ගයේ අධික බෑවුමක් සහිත මාර්ගයේ කොන්ක්‍රීට් කර ඇති කොටස් වලවල් හැරී ඇති බවත් ඒ අනුව මාර්ගයේ ගමන් ගන්නා වාහන වලට දැඩි අවධානමක් පවතින බවත්, කඩිනමින් අළුත්වැඩියා කර දෙන ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:04:04** මේ දක්වා සභිකයින් ඉදිරිපත් කර ඇති නඩත්තු යෝජනා වලින් ඉටුකර ඇති යෝජනා හා ඉටුකිරීමට ඇති යෝජනා ප්‍රමුඛතාවය මත පෙළ ගස්වා සභාව වෙත ඉදිරිපත් කිරීම( කාල සීමාවන්ද ඇතුළත්ව )

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් කර්මාන්ත කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති යෝජනා ප්‍රමුඛතා ගත කොට ක්‍රියාත්මක වන කාල සිමාව දැන ගැනීමට අවශ්‍ය බව පවසන ලදි.

ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා පැවසුයේ මාසික වශයෙන් ක්‍රියාත්මක කිරීමට හැකි යෝජනා පෙළ ගැස්වූ බවත්, කම්කරුවන් හිඟ වීමේ ගැටළුව සහ ජේ.සී.බී රථ දෙකම අක්‍රිය වීම යන ගැටළු හේතුවෙන් එම යෝජනා ඉටු කිරීමට

කාල සීමාව දීර්ඝ වීමට හේතු වූ බවත් ඉදිරියේදී විධිමත් ලෙස යෝජනා ප්‍රමුඛතාගත කොට ඉටු කිරීමට නියමිත බවත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:04:05** බුද්ධ ජයන්ති මාවතට හැරෙන ස්ථානයේ, දොරවෙල 1 පටුමගේ පඩි පෙළ අසල , දේගපිටිය බෝධිය අසල සූර්ය පැනල 3 ක් සවිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:04:06** ප්‍රාර්ථනා බෝධිය අසළ මාර්ගය සෝදාගෙන ගොස් ඇති බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:05 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**06:05:01** මෙම සභාවට මෙවර පත් වූ විපක්ෂ මන්ත්‍රීවරුන් හට ජෙෂ්ඨත්වය මත සභාවේ අසුන් ගැනීමට ආසන පිරිනැමීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක වීමේදී එකපෙළ අසුන්වල සිටීම පහසු බැවින් ඉහත යෝජනාව සිදු කළ බවයි.ගරු උප සභාපතිතුමා පැවසුයේ සභාවේ ජ්‍යෝෂ්ඨත්වය අනුව පෙළගැස්වීම සිදු කළද සභාවේ සභිකයන් සියළු දෙනාම එකම කණ්ඩායමක් බවත්, න්‍යාය පත්‍රය සභා වාරයට කලින් ලබා දෙන බැවින් අවශ්‍ය සංවිධානය වීම් සිදු වී පැමිණිය හැකි බවත්, ජ්‍යෝෂ්ඨත්වය සහ සභිකයන් ලෙස ගැසට් කළ අනුපිළිවෙළ මත සභාවේ පෙළගැස්වීම් කර ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ සභාවේ න්‍යාය පත්‍රයේ යෝජනා සඳහා වෙන් කළ යුතු කාලය කාල රාමුවක් සකස් කරන්නේ නම් සභාවේ කාලය ඉතිරි කළ හකි බවයි.

**06:06 ගරු නාගරික මන්ත්‍රී- එන්.ඒ.එස්.සිසිල චන්දන මැතිතුමා**

**06:06:01** බළන්ගොඩ නොනිදන නගරයක් කිරීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස සැප්තැම්බර් 26 සහ 27 දෙදින Street Festival වැඩ සටහනක් කුමාර විද්‍යාලීය මාර්ගයේ සිදුකිරීම. බළන්ගොඩ

නගර සභාවේ Street Food Festival වැඩ සටහන සඳහා සකස් කර ඇති ව්‍යාපෘති වාර්තාව අනුව කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී අදහස් දක්වමින් දැනට මෙම බළන්ගොඩ නගරය සාමාන්‍යයෙන් සවස 6-7 වන විට සම්පූර්ණයෙන්ම පාළු වැසී යන බවත්, බෙලිහුල්ඔය සංචාරක පුරවරයක් කරන බැවින් බළන්ගොඩ නගරය එහි කේන්ද්‍රස්ථානය බවට පත් විය යුතු බැවින් මෙවැනි සංකල්ප අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතු බවත්, ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඇති බවත්, එමඟින් සභාවට ආදායමක් ලබා ගැනීමේ හැකියාවක් පවතින බවත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:06:02** වැවවත්ත උද්‍යානයේ සේවා පියස පිහිටි භූමියේ එක් පසක් රන්ජිත් මහතාගේ නිවසට විවෘතව පවතින නිසා මෙහි ක්‍රීඩා කිරීමේ දි පන්දුව ඔහුගේ ඉඩමට යාම නිසා නිතර නිතර ක්‍රීඩා කරන දරුවන් සහ එම මහතා අතර ගැටුම් ඇති බැවින්, ඊට විසඳුමක් ලෙස එම සීමාව ආවරණය වන පරිදි දැලක් ගැසීමට සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, වැවවත්ත ප්‍රජා ශාලාව පිහිටි ඉඩම මැනුම් කටයුතු සිදුකර ඉඩම වටා වැටක් ගැසීම සුදුසු බවට යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:06:03** මෙම ගරු සභාවෙන් ජනතාවට සලසනු ලබන සේවා යාවත්කාලීන වීම සහ ඒවා ජනතාව අතරට ගෙන යාම සඳහා Social media භාවිතය සඳහා උනන්දුව හා හැකියාව ඇති නිලධාරී මහතෙකුට මෙම කාර්යය භාරදීමට සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් සභාව මඟින් ජනතාවට ලබා දෙනු ලබන සේවා පිළිබඳ සමාජ මාධ්‍යය හෝ වෙබ් අඩවි වැනි මාධ්‍යයක් තුළින් ජනතාව දැනුවත් කිරීම අරමුණු කරගෙන ඉහත යෝජනාව ඉදිරිපත් කළ බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**මධ්‍යාහ්න 12.00 ට පමණ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා,ගරු සභාපතිතුමා වෙත මූලාසනය භාර දෙන ලදී.**

**06:06:04** 2025 වර්ෂයේ බළන්ගොඩ නගර සභාවේ සහ අනුයුක්ත ආයතනවල සේවය කරන සේවක මහත්ම මහත්මීන් ඇගයීමේ සහ සුහද හමුවක් 2025 වර්ෂයේ දෙසැම්බර් මස සංවිධානය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:07 ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

**06:07:01** බැංකියවත්ත හා සඳුන්ගම මාර්ගය කාපර්ට් යොදා පිළිසකර කරන තෙක් ඇති වළවල් තාර යොදා  පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:07:02** කර්මාන්ත කමිටුව මගින් අනුමත කර මුදල් කමිටුවෙන් ද අනුමත වූ කර්මාන්ත බොහොමයක් තවමත් ආරම්භ වී නොමැත. ඒ සඳහා හේතුව කම්කරුවන්ගේ හිගකම බව දිගින් දිගටම ප්‍රකාශ වුවත් ජනතාවට වග කියන නියෝජිතයන් ලෙස අපිට කළ නොහැක. සභාවට හැකියාවක් නොමැති සියලුම කර්මාන්ත බාහිර පාර්ශවයන්ට ලබාදිය හැකි ක්‍රමවේදයක් සකස් කර කර්මාන්තය කඩිනම් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීක සේනාරත්න මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින්, සභාවෙන් කර්මාන්ත සිදු කිරීමට විවිධ ගැටළු පවතින්නේ නම් කර්මාන්ත කාරක සභාව හරහා යෝජනා වන කර්මාන්ත සිදු කිරීම කොන්ත්‍රාත් වශයෙන් බාහිර පාර්ශවයන් වෙත ලබා දීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:07:03** පොදු සුසාන භූමිය කඩිනමින් පිළිසකර කර උද්‍යාන භාරකරුවෙකු සතු කිරීම සඳහා පහත සඳහන් සංවර්ධන කටයුතු සිදුකිරීම.

- සුසාන භූමියේ පසු පස බැම්ම උස් කිරිම.
- ඉදිරිපස ගේට්ටුව පිළිසකර කිරීම.
- අනවශ්‍ය ගස් ඉවත් කිරීම.
- සුසාන භූමිය අභ්‍යන්තරයෙන් ගලා බසින කාණුව ක්‍රමවත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පවසා සිටියේ බුලත්ගම සුසාන භූමිය පමණක් නොව සභාව මඟින් පාලනය වන සුසාන භූමි සියල්ලම නඩත්තු කළ යුතු මට්ටමේ පවතින බවත්, කඩිනමින් නඩත්තු කළ යුතු බවත්, පළාත් පාලන සතිය ඉලක්ක කර

ගනිමින් කුමාරගම සුසාන භූමිය සුද්ද පවිත්‍ර කිරීම් සිදු කළ බවත්, එහි ඉඩම කොටසක් පුද්ගලයෙක් අනවසරයෙන් අල්ලා ගෙන සිටින බැවින් එහි ඉඩම් මැනුම් කටයුතු සිදු කර නිරවුල් කර ගැනීම් කටයුතු සිදු කරන බවත්,හදිසි මරණ වලදැමීම් සිදුවන බැවින් සෑම සුසාන භූමියකටම භාරකරුවෙකු අත්‍යවශ්‍ය බවත්, මෙම නඩත්තු කටයුතු සියල්ලම සිදු කල යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් තමන් ඉහත යෝජනාව පළමු සභා වාරයේදීම ඉදිරිපත් කල බවත්, නමුත් මේ වන තෙක්ම එම නඩත්තු කටයුත්ත සිදු වී නොැති බවත්, බුලත්ගම සුසාන භූමිය මේ වන විට ඉතාම ජරාජීර්ණ වී පවතින බවත්, සුසාන භූමිය ඇතුළත ඉවත් කළ යුතු ගස් බොහොමයක් පවතින බවත්, ස්මාරක විශාල ප්‍රමාණයක් දිරාපත් වී කඩා වැටී ඇති බවත්, අයිතිකරුවන් දැනුවත් කර අදාළ ස්මාරක ඉවත් කර නොගන්නේනම් සභාව මඟින් එම ස්මාරක ඉවත් කිරීම සිදු කරන ලෙසත්, එම සුසාන භූමිය තුළ ජලය, විදුලිය ආදී කිසිඳු පහසුකමක් මේ වන විට නොමැති බවත් කඩිනමින් ඉදිරිපත් කර ඇති නඩත්තු කටයුතු ඉටු කර දෙන ලෙසත්, ඉහත යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමාට ස්තූතිය පළ කරන බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා ඉහත සඳහන් කර ඇති අඩුපාඩු සියල්ලම ඉතාම පැහැදිලි බවත්,ඉවත් කළ යුතු මට්ටමේ පවතින ගස් සියල්ලම ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත්, සභාවේ කම්කරුවන් යොදවා සුද්ද පවිත්‍ර කිරීම් සිදු කිරීමටත් කාර්මික නිලධාරී මහතා වෙත උපදෙස් ලබා දෙන ලදී.වැඩිදුරටත් සුසාන භූමියේ පවතින ස්මාරක ඉවත් කිරීමට අධිකරණ නියෝග ගත යුතු බැවින් එය සිදු කළ නොහැකි බවත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:07:04** බළන්ගොඩ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියැලී සිටින අය හා ඒ සඳහා උනන්දුවක් දක්වන ව්‍යවසායකයන් සඳහා වැඩමුළුවක් සංවිධානය කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා අනුග්‍රහය ලබාදීම. තේ පැන් සංග්‍රහය , ප්‍රවාහන පහසුකම්

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පවසා සිටියේ බළන්ගොඩ පුරවරයේ සංචාරක කර්මාන්තයේ නියැලීමට හැකියාවක් සහ උනන්දුවක් දක්වන පිරිසක් සිටින බවත්, ඔවුන් දිරිගැන්වීමක් ලෙස වැඩමුළුවක් සංවිධානය කර සභාව අනුග්‍රහය දැක්විය යුතු බවත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:08 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා**

**06:08:01** බළන්ගොඩ නගර කොට්ඨාශයේ සිටි ගාර්ඩන් වෙදගෙදර මාර්ගයේ මනෝජ් මහතාගේ නිවස ඉදිරිපිට ඇති කාණු පද්ධතිය අබලන් වී ඇති හෙයින් අලුත්වැඩියාවක් හා ප්‍රතිසංස්කරණය කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:09 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**06:09:01**තුඹගොඩ මංසන්ධියේ රාස්සගල පාර මගී ආවරණය සැකසීම සඳහා සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා,ඉදිරිපත් කර ඇති යෝජනාව මින් පෙර සභාවාරවල දීද ඉදිරිපත් කළ බවත් නමුත් තුඹගොඩ සාංඝිකාරාමරයේ ස්වාමීන් වහන්සේ භූමිය පිළිබඳ එකඟතාව පල නොකළ බැවින් එම කාර්යය සිදු නොවූ බවත්, මේ වන විට ස්වාමීන් වහන්සේ ස්ථානයක් ලබා දීමට වාචික එකඟතාවය පළ කර ඇති බවත්,එබැවින් සභාවේ යෝජනා සම්මුතිය අවශ්‍ය බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ බස් නැවතුම්පොළවල් සකස් කිරීම සභාවේ විෂය පථයට අදාළ නොවන බැවින් මෙම ඉදිකිරීම වෙනුවෙන් අනුග්‍රාහකත්වයක් ලබා ගැනීමට සිදු වන බවයි.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා බස් නැවතුම්පළ ඉදිකිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසරය ලබා ගැනීම සභාවෙන් සිදු කළ යුතු බව පවසන ලදුව ගරු සභාපතිතුමා, ඊට අදාළ  අවසරය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දෙන බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:09:02** සදුන්ගම මාර්ගයට අනතුරුදායක ලෙස විදුලි කණුව උඩට කඩා වැටී අවධානම් ලෙස ඒ මත රැඳී ඇති කොස්ගස කපා ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පවසා සිටියේ ඉහත කොස්ගස කපා ඉවත් කිරීමට ගස් හිමිකරුවන් කටයුතු කරන බවත් එම ස්ථානයේ  විදුලි රැහැන් ඉවත් කිරීමක් කළ යුතු බැවින් ඒ වෙනුවෙන් සභාව මඟින් ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු වෙත දැනුවත් කිරීමක් කළ යුතු බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු වෙත අදාළ දැනුවත් කිරීම සිදු කිරීමට කටයුතු කරන බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:10 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා**

**06:10:01** ඇල්ලෙපොල කොට බෝධිය අසලින්ම පහළට දිවෙන කොන්ක්‍රීට් දැමූ මාර්ගයේ ඉතිරි කොටස මීටර් 30 ක් කොන්ක්‍රීට් දැමීමට ගරු සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:10:02** රුසිරු ලී මෝල ඉදිරියෙන් උඩට දිවෙන මාර්ගය මීටර් 35 ක් පමණ කොන්ක්‍රීට් කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:10:03** පහළ ඇල්ලෙපොල සමුපකාර ගොඩනැගිල්ලෙහි සේවා පියසක් සඳහා කඩ කාමර කිහිපයක් ලබාගැනීමට ගරු සභාවේ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සමුපකාර ගොඩනැගිල්ලෙහි පවත්නා හිස් ඉඩකඩ සභාව වෙත ඉල්ලුම් කර සේවා පියසක් පවත්වාගෙන යාමට හැකියාව පවතින බවත් එම ප්‍රදේශයේ ප්‍රජාශාලාවක් නොමැති බැවින් ප්‍රජාශාලාවකටත් සුදුසු ස්ථානයක් බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එම භූමිය සමුපකාරය වෙත හිමි බැවින් ඉහත ඉල්ලීම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:10:04** බළන්ගොඩ සිට රත්නපුර දෙසට යන විට කුමාරගම හංදියට පහළින් දකුණු දිශාවට නිමල් හෙලපල්ල මහතාගේ නිවස අසලින් උඩට දිවෙන මාර්ගය මීටර් 35 ක් පමණ කොන්ක්‍රීට් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 07. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පසුගියදා පැවති වෙල් උත්සවය වෙනුවෙන් පැවති දන්සල සඳහා ජල බවුසර් සේවාව ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීමේදී හදිසි ගිනි ගැනීමක් වෙනුවෙන් ජල බවුසරය අත්‍යවශ්‍ය බැවින් එය නවතා තැබීමේ ගැටළුවක් පවතින බව ඉල්ලුම්කරුවන් වෙත දැනුම් දුන් බවත්,නමුත් පසුව බවුසරය ලබා දී තිබූ බවත්,ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තූතිය පළ කරන බවත්, මෙවැනි සේවාවන් ලබා දීමේදී ලබා දෙන ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීමේදී එක් ම්‍යස්ථ මතයක සිටිය යුතු බවත්, එසේ

නොමැති විටදී දැනුවත් කිරීම් වලදී අපහසුතාවයට පත්වන බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ හදිසි ගිනි නිවීම් කටයුතු සඳහා සහ ජල බවුසරය අත්‍යවශ්‍ය බැවින් එම ස්ථානයේ ජල බවුසරය නවත්වා තැබීමට අවසර ලබා නොදීමට කටයුතු කළද අවසානයේ එම ස්ථානයේ ජලය ගබඩා කර තබා ගැනීමට අවශ්‍ය පහසුකම් නොමැති වූ බැවින් බවුසරය නවත්වා තැබීමට කටයුතු කළ බවයි.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් සභිකවරුන් ලෙස නිලධාරින්ගෙන් ඇතැම් කරුණු සම්බන්ධයෙන් විමසීම් කිරීමට සිදුවන බවත්, පළාත් පාලන ආයතන වලින් පරිබාහිර ආයතන වල සේවය කර ස්ථාන මාරු පැමිණෙන නිලධාරින් එය ඇතැම්විට බලපෑමක් සිදුකරන ලෙස දකින බවත්, පළාත් පාලන ආයතන වල සේවය කර පළපුරුද්දක් ඇති නිලධාරින් නිලධාරීන් එසේ නොවන බවත් එය ගැටළුවක් බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත කාරණාව සත්‍ය බවත් පළාත් පාලන ආයතන වල සේවය කරන නිලධාරින් ස්ථානමාරු සිදු කිරීමේදී පළාත් පාලන ආයතන අතරම ස්ථාන මාරු සිදු කරන්නේ නම් එවැනි ගැටළු සිදු නොවන බවත් එසේ නොමැති විටදී එම නිලධාරීන්ට මෙම ආයතනවලට අනුගත වීමට කාලයක් ගත වන බවත්ය.

## 08. අවසානය

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා සහ විශේෂයෙන් සභාව සාර්ථකව පවත්වා ගෙන යාමට නිරන්තර උපදෙස් ලබා දෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී තුමන්ලා වෙතද ස්තූතිය පුදකරමින් මධ්‍යාහ්න 12.30ට පමණ මෙදින මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**කේ. ජී.ප්‍රේමදාස,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.